# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/LH/09/හරිත දැයක්/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................ | දිනය<br>திகதி<br>Date | 2022.03.18 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත.

## හරිත දැයක් ජාතික ගෙවතු වගා සංග්‍රාමය - 2022

උක්ත වැඩසටහනෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීමේ විශේෂ රැස්වීමක් 2022.03.15 දින වාරිමාර්ග, ස්වදේශ කටයුතු අමාත්‍ය හා ගෘහස්ථ ගෙවතු වගා මෙහෙයවීම හා සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.03.15 දින පැවැත්විනි.

02. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ගෙවතු වගා වැඩසටහනෙහි සමාරම්භක උළෙල 2022.03.29 දින පැවැත්වීමට මෙම රැස්වීමේදී තීරණය කළ බැවින් ඒ සඳහා කටයුතු සුදානම් කරගන්නා මෙන් කාරුණිකව දන්වමි. ඒ සඳහා අවශ්‍ය පැල දැනටමත් ආරම්භ කර ඇති පැල තවාන් විසින් ලබාදීමට කටයුතු කළ යුතුය.

03. එමෙන්ම සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් හඳුනාගනු ලබන ගෙවතුලාභීන් අතුරින් සමෘද්ධි බැංකු කලාප මට්ටමින් හොඳම ගෙවත්ත හිමි ප්‍රතිලාභියා තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.මේ සඳහා **'හරිත දැයක්'** ජාතික ගෙවතු වගා සංග්‍රාමය 2022 මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ජාතික ගෙවතු වගා තරඟාවලිය යටතේ ලබාදී ඇති නිර්ණායක යොදා ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

04. මෙසේ බැංකු කලාප මට්ටමින් තෝරා ගනු ලබන හොඳම ගෙවත්ත ඉදිරියේදී ආදර්ශ ගෙවත්තක් ලෙස සංවර්ධනය කළ යුතු අතර මේ සඳහා එම ප්‍රතිලාභීන් හට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඒ සඳහා අවශ්‍ය ජීවනෝපාය සංවර්ධන ප්‍රතිලාභ ලබාදීමට නියමිතය.

මෙම කටයුතු සාර්ථක කර ගැනීමට ඔබ විසින් දක්වන දායකත්වය අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.

D/Live/Sen/Haritha Dayak.03.18


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல 1st Step, 4 th floor, Sethsiripaya Batt

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகப்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 01** |